සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 10 | |
| විෂයය / பாடம் / Subject | ගෘහ ආර්ථික විද්‍යාව | |
| පත්‍රය / வினாத்தாள் / Paper | I | |
| පැය / மணித்தியாலம் / Hours | 01 | |

සැලකිය යුතුයි.

(i) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 කි.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

(iv) I ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු II පත්‍රයේ පිළිතුරු සමඟ අමුණා භාර දෙන්න.

---

01. ප්‍රධාන ආහාර වේලක අඩංගු කළ හැකි ශක්තිය ලබා දෙන ආහාර වර්ග කිහිපයක් වනුයේ,

1. ඉන්නල, කොස්, දෙල් හා කිරි අල ය.
2. මඤ්ඤොක්කා, බතල, බෝංචි හා මාළු ය.
3. මස්, මාළු, කරවල හා බිත්තර ය.
4. යෝගට්, බටර්, මුංඇට හා කඩල ය.

02. මාෂභෝගවල බහුලව අඩංගු ප්‍රෝටීනය වනුයේ,

1. සෙයින් ය.
2. ඔරයිසීන් ය.
3. ලෙගියුමින් ය.
4. ග්ලූටනීන් ය.

03. ප්‍රෝටීන් පරිපූර්ණය කරන ලද ආහාරයක් වනුයේ,

1. මෙනේරි කිරිබත් ය.
2. ඉඹුල් කිරිබත් ය.
3. ලබු කිරිබත් ය.
4. මුං කිරිබත් ය.

04. සත්ත්ව හා ශාක ආහාරවල අඩංගු විටමින් A වල රසායනික නාමයන් පිළිවෙලින් හැඳින්වනුයේ,

1. බීටාකැරොටීන් හා ටොකොෆෙරෝල් ලෙස ය.
2. රෙටිනෝල් හා බීටාකැරොටීන් ලෙස ය.
3. තයමින් හා කෝලිකැල්සිෆෙරෝල් ලෙස ය.
4. බීටාකැරොටීන් හා රෙටිනෝල් ලෙස ය.

05. ශරීරයට අවශ්‍ය පමණට කැල්සියම් නොලැබීමෙන් දක්නට ලැබෙන ඌනතා රෝගයක් නොවන්නේ,

1. අස්ථි විකෘති රෝගය යි.
2. ඔස්ටියෝමැලේෂියා රෝගය යි.
3. කැරටොමැලේෂියා රෝගය යි.
4. ඔස්ටියෝපොරෝසිස් රෝගය යි.

13. පිටි හා මේදය ඇඟිලි තුඩුවලින්, විස්කෝතු කුඩු ආකාරයට පත්වන තෙක් මිශ්‍රකර සකස් කරන පිටි මෝලිය වනුයේ,

1. පෆ් පේස්ට්‍රිය ය.
2. ෂෝට් ක්‍රස්ට් පේස්ට්‍රිය ය.
3. පැටි පේස්ට්‍රිය ය.
4. ෂූ පේස්ට්‍රිය ය.

14. කෑම මේසයක් මත තැබීමට සුදුසු මල් සැකැස්මක් සඳහා යොදාගත හැකි මල් වර්ග වනුයේ,

1. රෝසමල් හා කපුරුමල් ය.
2. අරලියා මල් හා ඇන්තූරියම් මල් ය.
3. බාබන්ඩේසියා මල් හා සීනියාස් මල්ය.
4. පිච්ච මල් හා කැනාස් මල් ය.

15. විනාකිරි, සීනි, ලුණු යන ද්‍රව්‍ය සියල්ලම පරිරක්ෂක කාරක ලෙස භාවිත කර සකස් කරනු ලබන ආහාර දෙකක් වනුයේ,

1. සෝස් හා ජාඩි ය.
2. කරවල හා ජෑම් ය.
3. සෝස් හා චට්නි ය.
4. කෝඩියල් හා වම්බටු මෝජු ය.

16. තෙත් තාපය භාවිතයෙන් පිසිනු ලබන ආහාර වනුයේ

1. පෑන්කේක්, ආප්ප, රොටී හා තෝසේ ය.
2. පපඩම්, රෝල්ස්, මාළුපාන් හා කොකිස් ය.
3. ඔමලට්, මුරුක්කු, පේස්ට්‍රි හා පාන් ය.
4. හැලප, ලැවරියා, වටලප්පන් හා ඉඳිආප්ප ය.

17. දිගු කාලයක් තුළ සිරුරට අයඩීන් නොලැබීම නිසා, ඌනතාවයට ගොදුරුවන වර්ධන අවධියන් වනුයේ,

1. ළමා, ගර්භණී හා යෞවන අවධීන් ය.
2. ළදරු, ළමා හා ක්ෂීරණ අවධීන් ය.
3. ළමා, යෞවන හා මහළු අවධීන් ය.
4. ළදරු, ළමා හා යෞවන අවධීන් ය.

18. සංසේචනය වීමත් සමඟ, සෛල බෙදීම ආරම්භ වන අවධිය වනුයේ,

1. ඩිම්බ අවධිය ය.
2. කලල අවධිය ය.
3. භ්‍රෑණ අවධිය ය.
4. අණ්ඩ අවධිය ය.

19. උපත් බර කිලෝ ග්‍රෑම් 3.5 ක් වූ ළදරුවෙකුගේ, මාස 6 ක දී සාමාන්‍ය බර විය යුත්තේ,

1. කිලෝ ග්‍රෑම් 5 කි.
2. කිලෝ ග්‍රෑම් 4.5 කි.
3. කිලෝ ග්‍රෑම් 6 කි.
4. කිලෝ ග්‍රෑම් 7 කි.

06. වැඩිහිටියන්ට තම සිරුර තුළ නිපදවා ගතහැකි අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ලය වනුයේ,

1. මෙතියොනීන් ය. 2. ට්‍රිප්ටොෆැන් ය. 3. හිස්ටඩීන් ය. 4. ආර්ජිනීන් ය.

07. මානව පෝෂණය හා සම්බන්ධ ඛනිජ වර්ග කිහිපයක කාර්යයන් පහත දැක්වේ.

A. අස්ථි හා දත් වර්ධනය
B. රුධිර හිමොග්ලොබින් නිෂ්පාදනය
C. තයිරොක්සීන් හෝමෝනය නිපදවීම.
D. හිසකෙස් හා නිය වර්ධනය

ඉහත කරුණු අතුරෙන් යකඩ හා අයඩීන්වලට අදාළ කාර්යයන් පිළිවෙලින් දැක්වෙන්නේ,

1. A හා C වල ය. 2. B හා D වල ය. 3. A හා D වල ය. 4. B හා C වල ය.

08. මේද අම්ල වර්ගීකරණයෙහි දැක්වෙන, ඒක අසංතෘප්ත මේද අම්ලයක් සඳහා උදාහරණයකි,

1. ලෝරික් අම්ලය. 2. ඇරකිඩොනික් අම්ලය.
3. ඔලෙයික් අම්ලය. 4. ලිනොලෙනික් අම්ලය.

09. දෛනිකව ආහාර වේල් සැලසුම් කිරීමේ දී, වැඩිපුර අඩංගු කළ යුතු ආහාර වර්ග වනුයේ,

1. කිරි හා කිරි නිෂ්පාදන වර්ග ය.
2. මස්, මාළු, බිත්තර හා වියළි ඇට වර්ග ය.
3. එළවළු හා පළතුරු වර්ග ය .
4. බත්, පාන්, ධාන්‍ය හා අල වර්ග ය.

10. අවුරුදු 16 - 18 වයසැති ගැහැණු දරුවෙකුගේ දෛනික ශක්ති අවශ්‍යතාවය වනුයේ,

1. කිලෝ කැලරි 2100 කි. 2. කිලෝ කැලරි 2500 කි.
3. කිලෝ කැලරි 2875 කි. 4. කිලෝ කැලරි 3375 කි.

11. එන්සයිමීය ක්‍රියාකාරිත්වය නිසා ඒවායේ කැපූ පෘෂ්ඨ මත දුඹුරු පැහැවන ආහාර වර්ග වනුයේ,

1. ඇපල්, අළුකෙසෙල්, වම්බටු හා ඉදුණු අඹ ය.
2. ඇපල්, අන්නාසි, ගස්ලබු හා දොඩම් ය.
3. ගස්ලබු, පේර, කෙසෙල් හා ඇපල් ය.
4. දොඩම්, අන්නාසි, මිදි හා අලිපේර ය.

12. පාන්, බනිස් හා මාළුපාන් වැනි, ඝන පිටිමෝලි ආශ්‍රයෙන් සකස් කරන ආහාර පිළියෙළ කිරීමේ දී, භාවිත වන ශිල්පීය ක්‍රමය වනුයේ,

1. මිශ්‍ර කිරීම ය. 2. බීට කිරීම ය. 3. පදම් කිරීම ය. 4. අත්ගෑම ය.

20. ප්‍රොජෙස්ටරෝන් යනු,

1. පුරුෂ ප්‍රජනක හෝමෝනය කි.
2. ආහාර ජීර්ණක හෝමෝනය කි.
3. ශරීර වර්ධක හෝමෝනය කි.
4. ස්ත්‍රී ප්‍රජනක හෝමෝනය කි.

21. ගර්භණීභාවයට පත්වීම සඳහා ඉතා සුදුසු වයස් සීමාව වනුයේ,

1. වයස අවුරුදු16 - 25 අතර ය.
2. වයස අවුරුදු 20 - 30 අතර ය.
3. වයස අවුරුදු 25 - 40 අතර ය.
4. වයස අවුරුදු 18 - 35 අතර ය.

22. පුරුෂ ලිංගික හෝමෝන නිපදවනු ලබන්නේ,

1. වෘෂණ කෝෂ තුළ ය.
2. ශුක්‍ර ප්‍රනාල තුළ ය.
3. වෘෂණ තුළ ය.
4. පිටියුටරි ග්‍රන්ථිය තුළ ය.

23. පූර්ව ප්‍රසව අවධියට අයත් සති ගණන වනුයේ,

1. සති 40 කි.
2. සති 35 කි.
3. සති 45 කි.
4. සති 30 කි.

24. ස්ත්‍රී ප්‍රජනක පද්ධතිය තුළ සංසේචනය සිදුවනුයේ,

1. ගර්භාෂය තුළ දී ය.
2. යෝනි මාර්ගය තුළ දී ය.
3. ගැබ්ගෙල තුළ දී ය.
4. පැලෝපීය නාලය තුළ දී ය.

25. "වීරාභිවන්දනය" දැකිය හැකි අවධිය වනුයේ,

1. ළමා අවධිය යි.
2. වැඩිහිටි අවධිය යි.
3. යොවුන් අවධිය යි.
4. ගර්භණී අවධිය යි.

26. තරුණ තරුණියන් යොවුන් වියේ දී ස්වාධීනත්වය කරා යාමට කැමැත්තක් දක්වයි. මේ පිළිබඳව පැහැදිලි වන ප්‍රකාශය වනුයේ,

1. විවිධ විලාසිතා කෙරෙහි යොමු වී අත්දැකීම් ලබා ගනියි.
2. තීරණ ගැනීමේ දී වැඩිහිටි සහාය නොපතයි.
3. සමවයස් කණ්ඩායම් හා ක්‍රීඩාවල යෙදෙයි.
4. විනෝදාංශ තෝරා ගැනීමේ දී අනුකරණය කරයි.

27. නව යෞවන අවධියේ දී, කායික වර්ධනය හා සම්බන්ධව දැක්විය හැකි නිවැරදි ප්‍රකාශයකි.

1. අස්ථි ඝනත්වය වැඩිවීම.
2. ළමා ස්වරූපය වේගයෙන් වෙනස් වීම.
3. අත් පා කඳට වඩා අඩු වේගයකින් වර්ධනය වීම.
4. ශරීර කොටස් අතර අනුපාතය සමාන වීම.

28. ඇඳුමක සුන්දරත්වය වැඩි කිරීමට විසිතුරු මැහුම් ක්‍රම යොදාගත හැකිය. විසිතුරු මැහුම් ක්‍රම කිහිපයක් වනුයේ,

1. ලේසි ඩේසි මැස්ම, දම්වැල් මැස්ම හා රේන්ද ඇල්ලීම ය.
2. දම්වැල් මැස්ම, බොත්තම් ඇල්ලීම හා කතිර මැස්ම ය.
3. ලේසිඩේසි මැස්ම, දම්වැල් මැස්ම හා වාටි මැස්ම ය.
4. දම්වැල් මැස්ම, කතිර මැස්ම හා නැටි මැස්ම ය.

29. පටපණු කෝෂවලින් ලබා ගනුයේ,

1. කපු කෙඳි ය.
2. ලෝම කෙඳි ය.
3. සේද කෙඳි ය.
4. නයිලෝන් කෙඳි ය.

30. පතරොම් නිර්මාණයේ දී මැහුම් වාසි දක්වනුයේ,

1. නිර්මාණ රේඛා මඟිනි.
2. මැසීමේ රේඛා මඟිනි.
3. දිගත් රේඛා මඟිනි.
4. කැඩුණු රේඛා මඟිනි.

31. සෘජුකෝණාස්‍රාකාර ලිපි රඳවනයක් මැසීමේ දී වටේ දාරය මසා නිම කිරීමට වඩාත් සුදුසු වනුයේ,

1. වාටි මැසීම ය.
2. පෝරු යෙදීම ය.
3. බඳන යෙදීම ය.
4. පයිපින් කිරීම ය.

32. ළදරු ඇඳුම සඳහා පතරොම නිර්මාණය කිරීමට ගනු ලබන සෘජුකෝණාස්‍රාකාර කඩදාසිය, විකර්ණය ඔස්සේ නැමීමේ දී, ඇතිවන කෝණය,

1. අංශක 45 කි.
2. අංශක 60 කි.
3. අංශක 30 කි.
4. අංශක 90 කි.

33. ළදරු ඇඳුමෙහි උරහිස සඳහා යොදන මුට්ටුව හැරවිය යුත්තේ ඇඳුමෙ,

1. ඉදිරිපසට ය.
2. පිටුපසට ය.
3. දෙපසට ය.
4. දකුණු පසට ය.

34. ළදරු ඇඳුමේ කර, අත්කට හා වාටිය <u>වඩාත්</u> අලංකාර කර ගැනීමට යොදාගත හැකි ක්‍රම දෙකක් වනුයේ,

1. සිප්පි වාටිය මැසීම හා බීක්කු මැසීම ය.
2. බ්ලැන්කට් මැස්ම මැසීම හා නැටි මැස්ම මැසීම ය.
3. බීක්කු මැසීම හා බඳන යෙදීම ය.
4. දම්වැල් මැස්ම මැසීම හා බ්ලැන්කට් මැස්ම මැසීමය.

35.



බෝතල් ආවරණයෙහි මතුපිට විසිතුරු කිරීම සඳහා යොදාගත හැකි මෙම මෝස්තරය, මැසීමට වඩාත් සුදුසු වනුයේ,

1. සැටින් මැස්ම ය.
2. දම්වැල් මැස්ම ය.
3. ලේසි ඩේසි මැස්ම ය.
4. ප්‍රංශ ගැට මැස්ම ය.

36. විවාහ වීමෙන් පසු නව යුවලක් එකිනකා හා ඔවුන්ගේ නව ඥාතීන්ට හැඩගැසෙන අවධිය වනුයේ,

1. ද්විතියික අවධිය යි.
2. ආරම්භක අවධිය යි.
3. වර්ධක අවධිය යි.
4. සංකෝචන අවධිය යි.

37. පහත සඳහන් සම්පත් අතුරෙන් මානව සම්පත් වනුයේ,

1. මුදල් හා දේපල වේ.
2. ඉඩකඩ හා ආකල්ප වේ.
3. ජලය හා ප්‍රජා පහසුකම් වේ.
4. ශ්‍රමය හා ආකල්ප වේ.

38. නිදන කාමරයක් සැලසුම් කිරීමේ දී පෞද්ගලිකත්වය ආරක්ෂා කරගැනීමට නම්,

1. කාමරයේ මැදට සිටින සේ දොර යෙදිය යුතු ය.
2. කාමරයේ කෙලවරට සිටින සේ දොර යෙදිය යුතු ය.
3. කාමරයේ දොර විසිත්ත කාමරයට මුහුණලා යෙදිය යුතු ය.
4. කාමරයේ දොර නිවසේ නාන කාමරයට මුහුණලා යෙදිය යුතු ය.

39. නිවසට ස්වභාවික ආලෝකය හා වාතාශ්‍රය මැනෙවින් ලබා ගැනීම සඳහා යොදන අනුයෝගී ක්‍රම වනුයේ,

1. දොර, ජනේල තැබීම හා වීදුරු ගඩොල් ඇල්ලීම ය.
2. දොර හා ජනේල තැබීමය.
3. වහලට තහඩු යෙදීම හා දොරවල් ඇමීමය.
4. මැද මිදුල් හා පොකුණු යෙදීම ය.

40. කාමරයක ජනේල එකිනෙකට මුහුණලා තැබීම මගින්,

1. හරස් සංවාතනය සිදුනොවේ.
2. සිරස් සංවාතනය සිදුවේ.
3. හරස් සංවාතනය සිදුවේ.
4. සිරස් හා හරස් සංවාතනය සිදුවේ.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

1712

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 10 | |
| විෂයය / பாடம் / Subject | ගෘහ ආර්ථික විද්‍යාව | |
| පත්‍රය / வினாத்தாள் / Paper | II | |
| පැය / மணித்தியாலம் / Hours | 02 | |

පළමුවන ප්‍රශ්නය අනිවාර්යය වේ.
පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4 ක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. ළදරු ඇඳුම් මැසීම ව්‍යාපාරය කොටගත්, දරු සම්පතක් බලාපොරොත්තුවෙන් සිටින යුවලක් සඳහා අරවින්ද විසින් ගෘහ සැලැස්මක් අඳින ලදී. එම සැලස්මට අනුව ගොඩනගා ගන්නා ලද නිවසෙහි පදිංචි වූ මෙම යුවල, නිවසේ අභ්‍යන්තරය මෙන්ම අවට පරිසරය ද අලංකෘත ලෙස සකස් කරගන්නා ලදී.

නිවසේ ගෘහණිය මාළු හා එළවළු භාවිත කරමින් ආහාරපාන සකස් කරන අතර, ප්‍රධාන ආහාර වේල්වලින් පසු විවිධ පලතුරු වර්ග අහාරයට ගැනීම ද පුරුද්දක් කොටගෙන ඇත.

I. ගෘහ සැලසුම් ඇඳීමේ දී ඒවායේ පරිමාණය දක්වන මිනුම් ඒකක දෙක නම් කරන්න.

II. නිවස සංවිධානයේ දී, නිවස අලංකාර කිරීම සඳහා භාවිත කරන උපාංග හතරක් සඳහන් කරන්න.

III. ගුණාත්මක ලක්ෂණ ආරක්ෂා වන අයුරින් ආහාර පිළියෙල කිරීමේ ශිල්පීය ක්‍රම දෙකක් නම් කරන්න.

IV. ආහාර වේල් සැලසුම් කිරීමේ කාර්යය වඩාත් සාර්ථකව ඉටුකරගැනීමට අවශ්‍ය මඟ පෙන්වන මූලාශ්‍ර දෙකක් සඳහන් කරන්න.

V. අහාරවේල් සැලසුම් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් සඳහන් කරන්න.

VI. පලතුරුවල අඩංගු, ප්‍රතිඔක්සිකාරක ලෙස ක්‍රියාකරන විටමින් වර්ග දෙකක් නම් කරන්න.

VII. මාළුවල අඩංගු ඔමේගා 3 මේද අම්ලය මඟින්, ශරීරයට ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

VIII. ගර්භණී මවගේ රුධිර පීඩනය මැන බැලීමෙන් ඇයට අත්වන වාසියක් සඳහන් කරන්න.

IX. ළදරු ඇඳුම් සඳහා යොදාගන්නා මුට්ටුව හා පියවීමේ ක්‍රමය නම් කරන්න.

X. සම්මත මිනුමකට අනුව ළදරු ඇඳුම මසනු ලැබේ. සම්මත මිනුම යන්න හඳුන්වන්න.

(10 X 2 = ලකුණු 20)

02. (i) රෙදිපිළි සඳහා ගනු ලබන ශාකමය කෙඳි වර්ග තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) නිවසේදී, ගෘහ උපාංග නිර්මාණය තුළින් ගෘහණියකට සැලසෙන වාසි තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) a) ළදරු ඇඳුමක විවරය මසා නිමකර ගන්නා ආකාරය පියවර තුනකින් දක්වන්න.
b) ළදරු ඇඳුමක් අලංකාර කර ගැනීම සඳහා සුදුසු මෝස්තරයක් ඇඳ, එය මැසීම සඳහා යොදාගන්නා මැහුම් ක්‍රම සඳහන් කරන්න. (ලකුණු 04)

03. (i) අප ශරීරයේ නිරෝගී පැවැත්මට ජලයෙන් ඇති ප්‍රයෝජන තුනක් දක්වන්න. (ලකුණු 03)

(ii) පලාවර්ග ආහාරයකට සැකසීමේ දී, එයට දෙහි යුෂ එක් කිරීමෙන් අපේක්ෂා කරනු ලබන ප්‍රයෝජන තුනක් දක්වන්න. (ලකුණු 03)

(iii) නිරක්තියෙන් පෙළෙන පුද්ගලයකු තුළ දක්නට ලැබෙන රෝග ලක්ෂණ දෙකක් නම් කර, එම රෝගය නිවාරණය කර ගැනීමට ඔබ ලබාදෙන උපදෙස් සඳහන් කරන්න. (ලකුණු 04)

04. (i) ගර්භණී අවධියේ දී දෛනිකව වැඩිපුර ලබාදෙන පෝෂක තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) එම පෝෂකවල අවශ්‍යතාවය වැඩිවීමට බලපාන හේතු දෙක බැගින් දක්වන්න. (ලකුණු 03)

(iii) මාතෘ සායනයක දී ගර්භණී මවකගේ පෝෂණය හා සෞඛ්‍ය සම්බන්ධව සිදුකරන කාර්යයන් හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 04)

05. පුද්ගලයෙකුගේ කායික, මානසික සමාජයීය හා භෞතික අවශ්‍යතා සපුරාලීමෙන් ජීවිතයේ සාර්ථකත්වය සඳහා ලැබෙන පිටිවහල ඉමහත්ය.

(i) නිවසක් ගොඩනැගීම සඳහා භූමියක් තෝරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) නිවසක් සඳහා සැලසුමක් ඇඳීමේ දී අවධානය යොමුවිය යුතු ප්‍රධාන කරුණු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) "රාශිකරණය" යන්න හඳුන්වා, ඒ සඳහා උදාහරණ තුනක් ලියන්න. (ලකුණු 04)

06. (i) a) ප්‍රජනක පද්ධතිය හා සම්බන්ධ හෝර්මෝන ස්‍රාවය කෙරන, මොළයේ පිහිටා ඇති ග්‍රන්ථිය නම් කරන්න.

b) එම ග්‍රන්ථිය මගින් ස්‍රාවය කෙරෙන, ප්‍රජනක පද්ධතියට බලපාන හෝර්මෝනය නම් කර, එම හෝර්මෝනයෙන් ඉටුවන කාර්යය සඳහන් කරන්න. (ලකුණු 03)

ii. නව යොවුන් වියේ දී, ගැහැණු හා පිරිමි ළමුන්ගේ ඇතිවන ද්විතියික ලිංගික ලක්ෂණ තුන බැගින් ලියන්න. (ලකුණු 03)

iii." නව යොවුන් වියේ දී ඇතිවන මානසික වර්ධනය, තමා අවට වෙනස් වන පරිසරයට අනුගත වීමේ හැකියාව වර්ධනය කරයි". මෙම ප්‍රකාශය හේතු දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

07. i. ස්ත්‍රී ප්‍රජනක පද්ධතියේ පිහිටා ඇති, ගර්භාෂය තුළ සිදුවන කාර්යයන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 03)

ii ගර්භණීභාවයේ ලක්ෂණ තුනක් නම් කර, එම ලක්ෂණ ඇතිවීමට හේතුව බැගින් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. සාමාන්‍ය කාන්තාවකට සාපේක්ෂව, ගර්භණී මවකගේ දෛනික චර්යා, ගර්භණීභාවයට ගැලපෙන පරිදි වෙනස් කර ගත යුතු ය. එසේ වෙනස් කර ගත යුතු චර්යා දෙකක් සඳහන් කර, ඒ සඳහා හේතු පැහැදිලි කරන්න. (ලකුණු 04)